**වනජීවී හා වනසම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය**

**වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව**

**2025 පෙබරවාරි 2 ලෝක තෙත් බිම් දිනය සැමරීම නිමිත්තෙන්**
**අධ්‍යාපන අමාත්‍යාංශයේ සහභාගීත්වය සහිතව**
**වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා මධ්‍යම පරිසර අධිකාරිය ඒකාබද්ධව**
**විජය පුවත්පත් සමාගමෙහි මාධ්‍ය අනුග්‍රාහකත්වයෙන් දීප ව්‍යාප්තව පවත්වනු ලබන**
**තෙත් බිම් දින තරගාවලිය - 2025**

ලෝකයේ ජෛව විද්‍යාත්මක හා පරිසර විද්‍යාත්මක මෙන් ම ආර්ථික වශයෙන් ද ඉතා වැදගත් ලෙස සැලකෙන තෙත්බිම් පරිසරය ආරක්ෂා කර ගැනීමෙහි ලා ශ්‍රී ලංකාව ද පාර්ශව කරුවෙකු වේ. වර්තමාන තෙත්බිම් පරිසරයට ඇති වී තිබෙන තර්ජන හේතුවෙන් ගෝලීය ව මෙන් ම ශ්‍රී ලංකාව තුළ ද තෙත්බිම් බහුලව විනාශයට පත් වෙමින් පවතී. ජෛව පද්ධතියට හා පරිසරයට විශාල මෙහෙවරක් සිදු කරන මෙම තෙත්බිම් ආරක්ෂා කර ගැනීම හා සංරක්ෂණය කිරීම අප විසින් ඉටු කළ යුතු අත්‍යාවශ්‍ය කාර්යයකි. එබැවින් තෙත් බිම්වල වටිනාකම පිළිබඳව පාසල් සිසුන් මෙන්ම ප්‍රජාව දැනුවත් කිරීම තුළින් තෙත් බිම් සංරක්ෂණයෙහි ලා සුබවාදී ආකල්ප වර්ධනය කිරීමේ අරමුණින් මෙම තරග පැවැත්වේ.

1. තරඟ පිළිබඳව විස්තර -

| | තරගය | තරගයේ ස්වභාවය | පවත්වනු ලබන කාණ්ඩයන් | ජයග්‍රාහකයින් තෝරා ගැනීම |
|---|---|---|---|---|
| i. | තෙත් බිම් සම්බන්ධ ඡායාරූප තරගය | • තෙත් බිම් සම්බන්ධ ඡයාරූප තරඟය - Facebook (දක්ෂතම හා ජනප්‍රියතම ඡායාරූපය)<br>01. Professional Camera Photography - විවෘත<br>02. Digital Modified Photography - විවෘත<br>03. Mobile phone camera Photography - පාසල්<br>ජංගම දුරකථනයක් මගින් 2024 ලෝක තෙත් බිම් දින තේමාව වන " Protecting Wetlands For Our Common Future - අනාගතය උදෙසා තෙත්බිම් සුරකිමු" යන තේමාවට අනුකූල ව තමන් කැමති ඕනෑ ම තෙත් බිමක් සම්බන්ධයෙන් ගන්නා ලද ඡායාරූපයක් තමාගේ නම, ලිපිනය හා දුරකතන | විවෘත<br>(ශ්‍රී ලාංකික පුරවැසියෙකු වන ඕනෑම අයකුට ඉදිරිපත් විය හැක)<br>විවෘත<br>පාසල් -<br>1 වන කාණ්ඩය - 6,7,8 ශ්‍රේණි<br>2 වන කාණ්ඩය - 9,10,11 ශ්‍රේණි<br>3 වන කාණ්ඩය - 12,13 ශ්‍රේණි | දක්ෂතම ඡායාරූපය<br>• විධිමත් ව පත් කරන ලද විනිශ්චය මණ්ඩලය මගින් දක්ෂතම 1,2,3 ජයග්‍රාහකයින් තෝරා ගනු ලැබේ.<br>ජනප්‍රියතම ඡායාරූපය<br>• එක් එක් කාණ්ඩයෙන් යටතේ ඡායාරූප 13 බැගින් තෝරනු ලබන අතර එය Department of Wildlife Conservation, Sri Lanka facebook පිටුවෙහි ප්‍රදර්ශනය කරනු ලබයි.<br>• එසේ එක් එක් කාණ්ඩයක් යටතේ ප්‍රදර්ශනය කරනු ලබන ඡායාරූප සඳහා වැඩිම like ප්‍රමාණයක් ලැබෙන ඡායාරූපය ජනප්‍රියතම ඡායාරූපය ලෙස තෝරා ගනු ලැබේ. |

| | | | | |
|---|---|---|---|---|
| | | අංකය සහිත ව wetlandday2025@gmail.com විද්‍යුත් තැපැල වෙත යොමු කළ යුතු ය. | | |
| ii | ප්‍රහේලිකා තරඟය - විජය පුවත්පත | විජය පුවත්පත මගින් සති 4 ක කාලයක් තෙත්බිම් පිළිබඳ ප්‍රහේලිකා තරගයක් පැවැත්වීම | පාසල් සිසුන් සඳහා | • ජයග්‍රාහකයින් තේරීම විජය පුවත්පත මගින් සිදු කිරීම |
| iii | ඊ පෝස්ටර් තරඟය | වචන 100 ට අඩු ප්‍රමාණයක් හා ඡායාරූප 5 ක් යොදා ගෙන පෝස්ටර් නිර්මාණය කර ඉදිරිපත් කිරිම | විවෘත | • තෝරා ගනු ලබන ඊ පෝස්ටර් 13 ක් Department of Wildlife Conservation, Sri Lanka Instagram පිටුවෙහි ප්‍රදර්ශනය කරනු ලබයි.<br>• එසේ ප්‍රදර්ශනය කරනු ලබන ඊ පෝස්ටර් සඳහා වැඩිම like ප්‍රමාණයක් ලැබෙන පෝස්ටරය ජනප්‍රියතම ඊ පෝස්ටරය ලෙස තෝරා ගැනේ. |
| 2. | තෙත් බිම් සම්බන්ධයෙන් සිදු කරන ලද පර්යේෂණ වල සංක්ෂේපය (abstract) ඉදිරිපත් කිරිම<br><br>(3 minutes drill) | • විශ්ව විද්‍යාල සිසුන් විසින් තෙත් බිම් සම්බන්ධයෙන් සිදු කරන ලද පර්යේෂණ වල සංක්ෂේපය (abstract) ක් විය යුතු ය<br>• සෑම සංක්ෂේපය (abstract) ක්ම කදා (slide) 3කින් යුක්ත ව මිනිත්තු 3 ක ඉදිරිපත් කිරීමක් විය යුතු ය.<br>• Zoom හෝ Team භාවිතා කර ඉදිරිපත් කිරීම වීඩියෝ ගත කළ යුතු අතර, ප්‍රධාන පැනලයේ කදා (slide) හා පැති පැනලයේ ඉදිරිපත් කරන්නාගේ මුහුණ ප්‍රදර්ශනය විය යුතු ය.<br>• වීඩියෝ ගත කරන ආකාරය ද වීඩියෝවට ඇතුළත් විය යුතු ය.<br>• ඉදිරිපත් කිරීම පහත පරිදි නම් කළ (save) යුතු ය "WD research(name)"<br>• සංක්ෂේපය (abstract) ට පර්යේෂකගේ හෝ ආයතනය පිළිබඳ විස්තර ඇතුළත් නොවිය යුතු ය.<br><br>• සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාවෙන් වීඩියෝ ගත කර ඉදිරිපත් කළ හැක. | • විශ්ව විද්‍යාල<br><br>මෙරට සියලු රාජ්‍ය හා පෞද්ගලික විශ්ව විද්‍යාල වල දැනට අධ්‍යනයේ නියුතු වන ප්‍රථම උපාධිය අපේක්ෂිත සිසුන් (අවසන් වසර විභාග ප්‍රතිඵල නිකුත් කිරීමට ඇති සිසුන් ද ඇතුළත් වේ)<br><br>ඉදිරිපත් කිරීම් වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ මේ සඳහා විවෘත කර ඇති මාර්ග ගත ද්වාරය (online portal) ට upload කරන්න | • විධිමත් ව පත් කරන ලද විනිශ්චය මණ්ඩලයක් මගින් 1,2,3 ජයග්‍රාහකයින් තෝරා ගනු ලැබේ.<br>• විනිශ්චය මණ්ඩල තීරණය අවසාන තීරණය වන අතර, පර්යේෂණයේ බලපෑම, සම්බන්ධය, විද්‍යාත්මක බව හා ඉදිරිපත් කිරීමේ හැකියාව මෙහි දී සලකා බැලේ. |

| | | | | |
|---|---|---|---|---|
| | | • මෙම වසරේ තේමාවට අදාළ විස්තර සඳහා WWW.ramsar.org වෙත පිවිසෙන්න | | |

2. **ජයග්‍රාහකයින් තේරීම හා ත්‍යාග**

| | තරඟය | ත්‍යාග |
|---|---|---|
| i. | ඡායාරූප තරඟය | **දක්ෂතම ඡායාරූපය**<br>**පාසල්**<br>**1 වන කාණ්ඩය - 6,7,8 ශ්‍රේණි**<br>1 වන ස්ථානය - 25,000/-<br>2 වන ස්ථානය -20,000/-<br>3 වන ස්ථානය -15,000/-<br><br>**2 වන කාණ්ඩය - 9,10,11 ශ්‍රේණි**<br>1 වන ස්ථානය - 25,000/-<br>2 වන ස්ථානය -20,000/-<br>3 වන ස්ථානය -15,000/-<br><br>**3 වන කාණ්ඩය - 12,13 ශ්‍රේණි**<br>1 වන ස්ථානය - 25,000/-<br>2 වන ස්ථානය -20,000/-<br>3 වන ස්ථානය -15,000/-<br><br>**විවෘත**<br>1 වන ස්ථානය - 25,000/-<br>2 වන ස්ථානය -20,000/-<br>3 වන ස්ථානය -15,000/-<br><br>**ජනප්‍රියතම ඡායාරූපය**<br><br>පාසල් කාණ්ඩය -25,000/-<br>විවෘත කාණ්ඩය -25,000/ |
| 2 | ඊ පෝස්ටර් තරඟය | 1 වන ස්ථානය - 25,000/-<br>2 වන ස්ථානය -20,000/-<br>3 වන ස්ථානය -15,000/- |
| 3. | තෙත් බිම් පර්යේෂණ වල සංක්ෂේපය<br>(3 minutes drill) | 1 වන ස්ථානය - 30,000/-<br>2 වන ස්ථානය - 25,000/-<br>3 වන ස්ථානය - 20,000/- |

මීට අමතරව විනිශ්චය මණ්ඩලයෙහි තීරණ වලට අනුකූලව කුසලතා සහතික ද පිරිනැමේ.

4. **තරඟ කොන්දේසි -**

i. සෑම අයදුම්කරුවකු ම අමුණා ඇති ආකෘති අයදුම්පත සකස් කර නිසි පරිදි සම්පූර්ණ කර එවිය යුතු ය.
ii. පාසල් අයදුම්කරුවන්ගේ නිර්මාණ ස්වතන්ත්‍ර නිර්මාණයක් බවට මව/පියා/භාර කරු මගින් සහතික කර එවිය යුතු ය.
iii. විනිශ්චය මණ්ඩලය විසින් තෝරා ගන්නා සියලු ජයග්‍රාහී නිර්මාණ එවා ඇති ශිෂ්‍ය/ශිෂ්‍යාවන් තම පාසලෙහි ඉගෙනීම ලබන ශිෂ්‍ය/ශිෂ්‍යාවන් බවට විදුහල්පති/නියෝජ්‍ය විදුහල්පති/සහකාර විදුහල්පති වෙතින් තහවුරු කර ගැනීමට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කරනු ලබයි. එසේ නොවන අවස්ථා වල දී එම නිර්මාණ ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ.

iv. එක් අයදුම්කරුවකුට එක් තරග අංශයකින් එක් නිර්මාණයක් පමණක් ඉදිරිපත් කළ හැකිය.
v. තරඟය සඳහා ඉදිරිපත් කරනු ලබන සියලු ම නිර්මාණ අයදුම්කරුවන්ගේ ස්වතන්ත්‍ර නිර්මාණය විය යුතු අතර මීට පෙර පවත්වන ලද කිසිදු තරගයකට ඉදිරිපත් කර ජයග්‍රහණය කළ නිර්මාණ නොවිය යුතු ය.
vi. ජයග්‍රාහී නිර්මාණ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා මධ්‍යම පරිසර අධිකාරිය නිල වෙබ් අඩවිවල පළ කරනු ලබන අතර එහි අයිතිය එම ආයතන සතු ය.
vii. ඉදිරිපත් කරන ලද නිර්මාණය නැවත අයදුම්කරුවන් වෙත එවනු නො ලැබේ.
viii. සංවිධායක මණ්ඩලය විසින් ජයග්‍රාහී නිර්මාණ වානිජ්‍යමය පදනමින් නොවන මාධ්‍ය, ප්‍රචාරක සහ අධ්‍යාපන කටයුතු සඳහා යොදා ගැනීමට අයදුම්කරු එකඟ විය යුතු ය.
ix. මෙම තරගය සඳහා ඉදිරිපත් කරනු ලබන නිර්මාණ නැතිවීම, හානි වීම හෝ ප්‍රමාද වීම හා නිවැරදි ලෙස විද්‍යුත් තැපැල මගින් යොමු නො කිරීමෙන් ඇති වන ගැටලු සම්බන්ධයෙන් සංවිධායක මණ්ඩලය විසින් වග කියනු නො ලැබේ.
x. ඉහත තරඟ කොන්දේසිවලට පටහැනිව ක්‍රියා කිරීම, අසම්පූර්ණ අයදුම්පත් එවීම හෝ ප්‍රමාද වී අයදුම් කිරීම නිර්මාණ ප්‍රතික්ෂේප කිරීමට හේතු වේ.
xi. ඉහත තරගයේ විනිශ්චය අදාළ ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්ගෙන් සැදුම් ලත් විනිසුරු මඩුල්ලක් විසින් සිදු කරන අතර එම විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

5. නිර්මාණ ඉදිරිපත් කිරීම -

i. මෙම නිර්මාණ භාර ගනු ලබන අවසන් දිනය **2025.01.07** දින වේ.
ii. **එවනු ලබන සියළු නිර්මාණ හා අයදුම් පත්‍රය ඊ-මේල් පණිවුඩයක් මගින් wetlandday2025@gmail.com යන විද්‍යුත් ලිපිනයට එවිය යුතුය. එසේ එවනු එවනු ඊ-මේල් පණිවුඩයෙහි මාතෘකාව තමා ඉදිරිපත් වන තරඟයෙහි මාතෘකාව යෙදිය යුතුය (wetland day photography competition 2025, wetland day e-poster competition 2025, wetland day research abstract competition 2025 ) ලෙස දැක්විය යුතු ය. එලෙස එවනු ලබන ඊ-මේල් පණිවුඩය සඳහා පිළිතුරු පණිවුඩයක් මගින් ආපසු දන්වනු ලබන අතර එසේ නොලැබුනහොත් පහතින් දක්වා ඇති දුරකථන අංක වෙතින් විමසීම් සිදු කල හැකි ය.**
iii. තරඟය පිළිබඳව වැඩිමනත් තොරතුරු www.dwc.gov.lk, www.cea.lk, යන වෙබ් අඩවිවලින් හෝ පහත දුරකථන අංකය මගින් ලබා ගත හැක.

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව : 011 – 2888585,ස්වභාවික සම්පත් කළමනාකරණ අංශය
දිගු අංකය 640, 642

අධ්‍යක්ෂ ජනරාල්,
වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව,
අංක 811/A, ජයන්තිපුර පාර, බත්තරමුල්ල.

## ආදර්ශ අයදුම්පත්‍රය

### 2025 පෙබරවාරි 2 ලෝක තෙත් බිම් දිනය සැමරීම නිමිත්තෙන් පවත්වනු ලබන
### දීප ව්‍යාප්ත තරගාවලිය

1. තරගයේ නම : ..........................................................................................
2. නිර්මාණයෙහි තේමාව : ..........................................................................................
3. i. තරගකරුගේ නම : ..........................................................................................
   ii.ඉංග්‍රීසි භාෂාවෙන් ..........................................................................................
4. i.පෞද්ගලික ලිපිනය : ..........................................................................................
   ii.ඉංග්‍රීසි භාෂාවෙන් .......................................................................................... .
   දුරකථන අංකය : ස්ථාවර - .................................. ජංගම - .....................................
5. ජාතික හැඳුනුම්පත් අංකය (පාසල් සිසුන් ඇත්නම් පමණක් දක්වන්න) : .........................................
6. විශ්ව විද්‍යාල සිසුන් නම් විශ්ව විද්‍යාල හැඳුනුම්පතෙහි අංකය (එහි පිටපතක් අමුණන්න) :............................
7. ස්ත්‍රී/පුරුෂ භාවය : .......................
8. උපන් දිනය : ......................................... වයස .....................................
9. i.පාසලේ/විශ්ව විද්‍යාලයේ නම හා ලිපිනය : ..........................................................................................
   ..........................................................................................
   ii. ඉංග්‍රීසි භාෂාවෙන් : ..........................................................................................
   ..........................................................................................
   iii පාසලේ/විශ්ව විද්‍යාලයෙහි දුරකථන අංකය
10. ශ්‍රේණිය : ..........................................................................................
11. විශ්ව විද්‍යාල සිසුන් නම් වසර : ..........................................................................................

මෙම නිර්මාණය මාගේ නිර්මාණයක් බවත් මෙහි සඳහන් සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් තරගය සම්බන්ධයෙන් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සඳහන් කර ඇති සියළුම නීති රීතිවලට එකඟ වන බවත්, තව ද ජයග්‍රාහී නිර්මාණ වානිජ්‍යමය පදනමින් නොවන සංරක්ෂණ කටයුතු හා අධ්‍යාපන කටයුතු සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, මධ්‍යම පරිසර අධිකාරිය හා විජය පුවත්පත් සමාගම විසින් යොදා ගැනීම, ප්‍රදර්ශනය කිරීම පිළිබඳව මා එකඟ වන බවත් සහතික වෙමි.

දිනය : .................................. අත්සන : .................................................

**විදුහල්පති/ නියෝජ්‍ය විදුහල්පති/ සහකාර විදුහල්පති/ අංශ භාර ගුරු මහත්මියගේ නිර්දේශය**

මේ සමඟ අමුණා ඇති පෝස්ටර් නිර්මාණය මෙම පාසලෙහි ........................................................ ශ්‍රේණියෙහි ඉගෙනුම ලබන ........................................................ ශිෂ්‍යයා/ශිෂ්‍යාවගේ ස්වාධීන නිර්මාණයක් බව මෙයින් සහතික කරමි.

නම : …………………………………………………………………

අත්සන : …………………………………………………………………

දිනය : …………………………………………………………………

නිල මුද්‍රාව : …………………………………………………………………